# BUSINESS PLAN
# (Part - I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ව්‍යාපාර අදහස

පුද්ගලයකුගේ හෝ සංවිධානයක හෝ අවශ්‍යතාවක් හෝ වුවමනාවක් ඉටු කළ හෝ හැකි නිෂ්පාදිතයක් පිළිබඳ ව ව්‍යවසායකයකු තුළ ඇති වන සිතිවිල්ල ව්‍යාපාර අදහසක් ලෙස හැඳින්විය හැකිය. එම ව්‍යාපාර අදහස් සාර්ව හා සූක්ෂ්ම විශ්ලේෂණයක් මගින් ව්‍යාපාර අවස්ථාවක් තීරණය කළ යුතු ය. ව්‍යාපාර අදහස් සියල්ල අතරින් යෝග්‍ය ව්‍යාපාර අදහස හඳුනා ගැනීම සඳහා සියලුම අදහස් ඇගැයීමට ලක් කිරීම සාර්ව විශ්ලේෂණය ලෙස හැඳින්වේ. මෙහි දී ව්‍යාපාරයේ බාහිර පරිසර සාධක අනුව ඇගයීමක් කළ යුතු ය.

- **සාර්ව පරිසර සාධක**

නිදසුන් :

- ආර්ථික පරිසරය
- ප්‍රජා පරිසරය
- සමාජ හා සංස්කෘතික පරිසරය

ClassWork.LK

සාර්ව විශ්ලේෂණය මඟින් හඳුනා ගත් ව්‍යාපාර අදහස් අතරින් ව්‍යවසායකයාට වඩාත්ම ප්‍රතිලාභ ගෙන දෙන ව්‍යාපාර අදහස තෝරා ගැනීම සඳහා එම ව්‍යාපාර අදහස් සූක්ෂ්ම විශ්ලේෂණයකට භාජනය කෙරේ. මෙහි දී අභ්‍යන්තර හා ආසන්න පරිසර සාධක අනුව ඇගයීමක් කළ යුතු ය.

- **<u>සූක්ෂ්ම සාධක</u>**

1. **අභ්‍යන්තර පරිසර සාධක**

නිදසුන් :

අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ, සම්පත්

2. **ආසන්න පරිසර සාධක**

නිදසුන් :

ගනුදෙනුකරුවෝ, සැපයුම්කරුවෝ, තරගකරුවෝ

ClassWork.LK

එසේ තීරණය කළ ව්‍යාපාර අවස්ථාව සඳහා ව්‍යාපාර සැලැස්මක් පිළියෙළ කළ යුතු ය. නව ව්‍යාපාර අවස්ථා සඳහා මෙන් ම, පවත්නා ව්‍යාපාරයක් පුළුල් කිරීමේ දී ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේ දී, ව්‍යාපාරයක් නවීකරණය කිරීමේ දී, හා ව්‍යාපාරයක් මිල දී ගැනීමේ දී ද ව්‍යාපාර සැලැස්මක් පිළියෙළ කරයි.

## ව්‍යාපාර සැලැස්ම : Business Plan

ව්‍යාපාර සැලැස්මක් යනු ව්‍යාපාරයක අරමුණු හා පරමාර්ථ ද, ඒවා ළඟා කර ගන්නා ක්‍රමෝපායන් ද විස්තර කෙරෙන ලේඛනයකි. මෙය ව්‍යාපාරයේ අදහස ගමන් මඟ දැක්වෙන මාර්ග සිතියමකි.

ClassWork.LK

# ව්‍යාපාර සැලැස්මක වැදගත්කම

- ව්‍යාපාර සැලැස්ම මඟින් ව්‍යාපාරය අනාගතයේ දී යා යුත්තේ කොතැනට ද යන්න පෙන්නුම් කිරීම (දැක්ම, නිෂ්ටාව, ඉලක්ක, පරමාර්ථ පැහැදිලි කිරීම)

- ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ට ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම.

- ව්‍යාපාරයකට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමට.

- ව්‍යාපාරයකට අවශ්‍ය සම්පත් හඳුනා ගැනීම හා සම්පත් නිසි පරිදි හසුරුවාලීමට පහසු වීම.

ClassWork.LK

- සියලු දෑ උචිත ව දැක්වීම මගින් අනාගත ව්‍යාපාරික කටයුතු මනා ලෙස ක්‍රමානුකූල ව සංවිධානය කර ගැනීමට හැකි වීම.

- ව්‍යාපාරයේ කාර්ය සාධන ඇගයීම සඳහා ප්‍රායෝජනයට ගත හැකි වීම.

- ව්‍යාපාරයේ තනතුරු සඳහා සේවකයන් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වීම.

- නියාමනය හා පාලනය පහසු වීම.

ClassWork.LK

# ව්‍යාපාර සැලැස්මක් පිළියෙළ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමට ව්‍යාපාරිකයාට මනා අවබෝධයක් තිබිය යුතු අතර, සැලැස්ම පුරා ම පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

## 1. පැහැදිලි ඉම (Focus )

ඔබ කවරෙක් ද? ඔබ ඉදිරිපත් කිරිමට අදහස් කරන භාණ්ඩය හෝ සේවාව හෝ කුමක් ද? ව්‍යාපාරය ආරම්භ කරන්නේ කෙසේ ද? එය වර්ධනය කරන්නේ කෙසේ ද? යන්න පැහැදිලි ව දැක්වීම

## 2. ගනුදෙනුකරුවෝ (Customers)

ඔබගේ ඉලක්ක ගනුදෙනුකරුවන් පැහැදිලි ව ම හඳුනා ගන්න. ඔවුන් කරා ළඟා වන්නේ කෙසේ ද යන්න පැහැදිලි ව දක්වන්න.

Class Work.LK

## 3. ඉලක්ක

ප්‍රධාන ඉලක්ක හා ඒවා කරා ළඟා වන ආකාරය හා ඒවා වෙළෙඳ පොළට සාධාරණ ද යන්න පිළිබඳ වත් ඉලක්කවල සාර්ථක අසාර්ථක භාවය පිළිබඳ වත් ඇගයීමක් කරන්නේ කෙසේ ද යන තොරතුරු දැක්වීම.

## 4. අවශ්‍ය මූල්‍ය සම්පත්

ව්‍යාපාරය ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණය කොපමණ ද? යන්න හා අවශ්‍ය මුදල් ලබා ගන්නේ කෙසේ ද යන්න දැක්වීම.

ClassWork.LK

# ව්‍යාපාර සැලැස්මක ඇතුළත් විය යුතු අංග

- මුල් පිටුව - Cover page
- විධායක සාරාංශය - Executive summery
- ව්‍යාපාර විස්තරය - Business Discription
- අලෙවිකරණ සැලැස්ම - Marketing Plan
- මෙහෙයුම් සැලැස්ම - Operational Plan
- මානව සම්පත් සැලැස්ම - Human Resources Plan
- මූල්‍ය සැලැස්ම - Financial Plan
- ඇමුණුම් - Apendixes

ClassWork.LK

# <u>මුල් පිටුව : Cover page</u>

ව්‍යාපාරයකට සුවිශේෂ වූ අනන්‍යතාව මුල් පිටුවෙන් ඉදිරිපත් කළ හැකි ය. ව්‍යාපාරයට අදාළ හඳුනා ගැනීමේ සංකේත ඇතුළත් කිරීමට උචිත ස්ථානය මුල් පිටුව යි.

ව්‍යාපාරය හඳුනා ගැනීමට අදාළ තොරතුරු (ලිපියොමුව, දුරකතන අංක, ෆැක්ස්, වෙබ් අඩවිය) මුල් පිටුවේ ඇතළත් කළ යුතුය. සැලැස්ම පිළිබඳව කිසියම් ප්‍රශ්නයක් හෝ තොරතුරක් හෝ සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කළ යුතු පුද්ගලයාගේ නම ද මෙහි ඇතුළත් කළ යුතු ය.

ClassWork.LK

## විධායක සාරාංශය : Executive summery

ව්‍යාපාර සැලැස්මක ඇතුළත් මූලික කරුණු සංක්ෂිප්ත කොට දක්වන කොටස විධායක සාරාංශය ලෙස හැඳින්වේ. සැලැස්ම කියවන්නාට සමස්ත සැලැස්ම පිළිබඳ දළ අවබෝධයක් ලබා දෙන කොටස මෙය වන අතර මෙය සෑම විට ම කෙටි හා ආකර්ෂණීය විය යුතු ය.

## ව්‍යාපාර විස්තරය : Business Discription

ව්‍යාපාරය කුමක් ද යන්න හා ව්‍යාපාරය සපයනු ලබන භාණ්ඩය හෝ සේවාව හෝ පිළිබඳ විස්තරත් එමගින් ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභත්, එහි සුවිශේෂත්වය විස්තර කෙරෙන කොටස යි. එහි පහත සඳහන් තොරතුරු ඇතුළත් වේ.

ClassWork.LK

# ව්‍යාපාර විස්තරයක ඇතුලත් තොරතුරු

- ව්‍යාපාරයේ නම හා ලිපිනය
- ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ
- ආදි කර්තෘවරු
- සංවිධාන ව්‍යූහය
- සංවිධාන ක්‍රමය
- අධ්‍යක්ෂ මණ්ඩලය
- භාණ්ඩ හා සේවා පිළිබඳ විස්තර

ClassWork.LK

## අලෙවිකරණ සැලැස්ම : Marketing Plan

වෙළෙඳ පොළ තරගකාරීත්වය, අලෙවි උපාය මාර්ග, විකුණුම් පූරෝකථනය ආදි තොරතුරු සවිස්තරාත්මක ව ඉදිරිපත් කරන කොටස අලෙවි සැලැස්ම වේ.

## මෙහෙයුම් සැලැස්ම : Operational Discription

නිෂ්පාදන ක්‍රියාපටිපාටි, නිෂ්පාදන යන්ත්‍ර සහ උපකරණ, අවශ්‍ය නිෂ්පාදන ප්‍රමාණය, කර්මාන්ත ශාලාව, ස්ථානගත කිරීම, නිෂ්පාදනයේ දී අනුගමනය කරන ජාතික හා අන්තර්ජාතික ප්‍රමිති ආදි විසත්ර ඇතළත් කෙරෙන කොටස මෙහෙයුම් සැලැස්ම ලෙස හඳුන්වයි.

ClassWork.LK

## මානව සම්පත් සැලැස්ම : Human Rsources Plan

ආයතනයක අනාගත මානව සම්පත් අවශ්‍යතා නිශ්චය කිරීමත්. එකී අවශ්‍යතා ඉටු කර ගන්නා ආකාරයත් ඇතුළත් කෙරෙන කොටස මානව සම්පත් සැලැස්ම වේ.

## මූල්‍ය සැලැස්ම : Financial Plan

ව්‍යාපාරයක සියලු ම ඇස්තමේන්තු ගත මූල්‍ය තොරතුරු ඇතුළත් වන කොටස මූල්‍ය සැලැස්ම වේ.

ClassWork.LK

## ඇමුණුම් : Apendix

ව්‍යාපාරය සැලැස්ම අවසානයේ ඉදිරිපත් කළ යුතු තොරතුරු

- රූප සටහන්
- ප්‍රස්තාර සහ වගු
- දත්ත වාර්තා
- ජීව දත්ත විස්තර
- අනුපාත

ClassWork.LK

# ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරන විට විශේෂ සැලකිල්ලක් යොමු කළ යුතු කරුණු.

- සිත් ඇදගන්නා සුලු නිමාවකින් යුතු ව මුල් පිටුව සැකසීම. මුල් පිටුවේ ආයතනයේ නම, ලිපියොමුව, දූරකථන අංක, E-mail යොමුව ආදිය සඳහන් කළ යුතු ය.

- පටුන නිවැරදි පිටු අංක සහිත ව මනා ව ඉදිරිපත් කිරීම.

- හොඳ කඩදාසියක මුද්‍රණය කර ඉදිරිපත් කිරීම.

- වැඩි දුරටත් විස්තර කළ යුතු කරුණු ඇතොත් ඒවා ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කිරීම.

- වැදගත් තොරතුරු මතු කර දැක්වීම.

- සෑම ප්‍රධාන මාතෘකාවක් ම නව පිටුවකින් ආරම්භ කිරීම.

ClassWork LK

- වගු යොදන විට හිස්තැන් නොමැති ව සැකසීම.

- සියලු ම වගු අංක, මාතෘකා හා දත්ත මූලාශ්‍ර දක්වා තිබීම.

- අංක භාවිතය අනුපිළිවෙළින් යෙදීම.

නිදසුන් : 1.0

1.1

1.2

1.2.1

1.2.2

- දැකුම්කලු පොත් පිංචක් (Book let) ලෙස සැකසීම.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura